සවියෙන් පෙරට - අපි එකට
e-ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය


| විෂයය | ශ්‍රේණිය | වාරය | පාඩම |
|---|---|---|---|
| භූගෝල විද්‍යාව | 8 | 2 | 03. දකුණු ආසියාව |



සැකසුම-කේ.රාජිකා කුමුදුනී
බප/හො/දීපාලෝක මහා විද්‍යාලය

# දකුණු ආසියාවට අයත් රටවල්

- ශ්‍රී ලංකාව
- ඉන්දියාව
- පාකිස්තානය
- බංගලාදේශය
- භූතානය
- නේපාලය
- මාලදිවයින





✓ දකුණු ආසියානු භූගෝලීය ප්‍රදේශයට-
*නිකොබාර් දූපත්
*අන්දමන් දූපත් ද අයත් වේ.

# දකුණු ආසියානු කලාපයේ සාපේක්ෂ පිහිටීම

- උතුරින්- හිමාලය කඳු පන්තිය
- දකුණින්- ඉන්දියන් සාගරය
- නැගෙනහිරින්-බෙංගාල බොක්ක
- බටහින්- අරාබි මුහුද

යන පිහිටීම වලින් දකුණු ආසියානු කලාපය මායිම් වේ.




# දකුණු ආසියානු කලාපයේ නිරපේක්ෂ පිහිටීම


සමකයේ සිට උතුරු අක්ෂාංශ 38° දක්වාත් නැගෙනහිර දේශාංශ 60°-100° දක්වා පරාසයක මෙම කලාපය විහිදේ.

# දකුණු ආසියානු කලාපය සමස්ත පෘථිවි තලයෙන් 3% භූමි ප්‍රදේශයක විහිදෙයි.

- සුවිශේෂී භූගෝලීය ලක්ෂණ රැසක් නිසා අනෙක් කලාපවලින් වෙන්කර හඳුනාගත හැක.

උදා- ** මුහුදු මට්ටමේ පිහිටි සුන්දරබාන් වගුරුබිම

** ලොව ඉහළම උන්නතාංශය එවරස්ට් කඳු මුදුන





- අධික ශීතල ඇති ප්‍රදේශ අධික, අධික උෂ්ණත්වයක් ඇති ප්‍රදේශ, ඝන වනාන්තර, තෘණ භූමි විවිධ දේශගුණ වෘක්ෂලතා විවිධත්වය නිසා දකුණු ආසියානු කලාපය සුවිශේෂී වේ.
- එම විවිධත්වය මානුෂ ක්‍රියාකාරකම් තුළ සුවිශේෂී වෙනසක් පෙන්නුම් කිරීමට හේතු වී ඇත.





# සාර්ක් සංවිධානය

- දකුණු ආසියා කලාපයේ රටවල් එක්වා පිහිටුවා ඇති දේශපාලන සංවිධානයක් වන සාර්ක් සංවිධානයට මෙම භූගෝලීය කලාපයේ රටවල් 7ට අමතරව මධ්‍යම ආසියා භූගෝලීය කලාපයට අයත් ඇෆ්ගනිස්ථානය ද අයත් වේ.



# දකුණු ආසියානු රටවල අගනුවර

- ශ්‍රී ලංකා- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
- ඉන්දියාව- දිල්ලිය
- බංගලාදේශය- ඩකා
- පාකිස්තානය- ඉස්ලාමාබාද්
- භූතානය- තිම්පු
- නේපාලය- කත්මණ්ඩු
- මාලදිවයින- මාලේ



- මෙම කලාපයේ පවතින්නේ නිවර්තන දේශගුණයයි
- මෙම කලාපයේ රටවල් දිගු වෙරළ තීරයකින් වට වී පැවතුනත් නේපාලය හා භූතානය වෙරළ තීරයක් හිමි නැති රටවල් වේ.

# දකුණු ආසියා කලාපයේ භූ දර්ශනය

දකුණු ආසියානු කලාපය තුළ භූමිය මෙන්ම එම භූමි ප්‍රදේශය තුළ මිනිස් ක්‍රියාකාරකම්වල විවිධත්වයක් ඇත. එබැවින් මෙම කලාපයේ භූ දර්ශනයේ ඇති සුවිශේෂී ලක්ෂණ ඇසුරෙන් භූ දර්ශන කලාප 06කට බෙදා දැක්විය හැක.

## 1. කඳුකර භූ දර්ශනය



## 2. නිම්න භූ දර්ශනය




## 3. වෙරළබඩ භූ දර්ශනය



## 4. ග්‍රාමීය භූ දර්ශනය



## 5. කාර්මික හා නාගරික භූ දර්ශනය



# 6. කාන්තාර භූ දර්ශනය





# කඳුකර භූ දර්ශනය

- දකුණු ආසියානු කලාපයේ මාලදිවයින හැර අනෙක් සෑම රටකම කඳුකර භූ දර්ශනයට අයත් විවිධ උසකින් යුතු කඳු පන්ති හා ඒවායෙහි විවිධාකාර භූ දර්ශනද දැක ගත හැකිය.




- ඉන්දියාව- හිමාලය කඳු වැටිය
- පාකිස්ථානය- හින්දුකුෂ්
  - සුලෙයිමාන්
- ශ්‍රී ලංකාව- මධ්‍යම කඳුකරය

# ඉන්දියාවේ කඳුකර භූ දර්ශනය



## කඳුකර භූ ලක්ෂණයේ සුවිශේෂතා
## (මහා හිමාලයේ කඳු වැටිය ඇසුරෙන්)

- මහා හිමාලයා කඳුවැටියට අයත් ප්‍රධාන කඳුවැටි-කුන්ලුන්ෂාන්
  -හිමාලය
  -කාරකෝරම්
- භූ ලක්ෂණ- කඳු/ නෙරු/ ගැඹුරු ගංදොරු/ දුර්ග උස්බිම්/ සානු/ කපොලු
- මුහුදු මට්ටමේ සිට 8000m පමණ උසති.
- කඳුවැටිය 2500km පමණ ප්‍රදේශයක පැතිර ඇත.
- ලොව උසම කඳු මුදුන් 14න් 9ක්ම මෙම භූ දර්ශනය තුළ දැකිය හැක.

# හිමාලය කඳුවැටියේ දේශගුණය



- මෙහි සමක දේශගුණයේ සිට ධ්‍රැව දේශගුණය දක්වා විවිධ දේශගුණික ලක්ෂණ දැකිය හැක.
- මෙම භූ දර්ශනයේ උන්නතාංශය වැඩිවන විට ශීත වන අතර උන්නතාංශය අඩුවන විට තෙත් ගතිය වැඩිය.

උදා: ** හිම මිදුණු එවරස්ට් කඳු මුදුන - උන්නතාංශය වැඩිවන ශීත වේ.

**නේපාලයේ ටෙරායි නිම්නය-

උන්නතාංශය අඩුවන විට උණුසුම් දේශගුණික ලක්ෂණ ඇති වේ.




- මෙම ප්‍රදේශය විශාල පරාසයක පැතිරුණු හැක හා සත්ත්ව විශේෂ දැකිය හැක.

# මෙම ප්‍රදේශයේ ශාක හා සත්ත්ව විවිධත්වය









# හිමාලය කඳුකරයේ මානව භූ දර්ශනය



- හිමාලය කඳුකරයේ

  මොංගොලොයිඩ් ජනවර්ගයට අයත්

  ගෝත්‍රික ජනවර්ග කිහිපයක් වාසය කරයි.

උදා-භූටියා, කසා, දරඩි, ලෙප්චා, ෂෙර්පා

- මෙම භූ දර්ශනය තුළ විවිධ ආගම් හා විවිධ සංස්කෘතීන් ද ඇත.
- හිම සහිත කඳුකරයට ආවේණික විනෝදාත්මක කටයුතු ඇත.

උදා-කඳු නැගීම, හිම ක්‍රීඩාව, සංචාරක කර්මාන්තය



- මිනිසුන්ගේ ශරීර ස්වභාවය කඳු නැගීමට හැකිවන ලෙස ශක්තිමත්ව පිහිටා ඇත.

  උදා- * පැතලි පුළුල් පතුල් සහිත පාද බර ඉසිලීමට හැකි ලෙස ශක්තිමත්වූ බාහු

  * අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත්වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු

# ජීවන රටාව

- කඳුකර ජනතාවගේ ජීවන රටා අතර කෘෂි කර්මාන්තය සත්ත්ව පාලනය ප්‍රධාන වේ. කඳුකර ප්‍රදේශවල ගවයන් හා බැටළුවන් ඇති කරයි.
- මීට අමතරව සංචාරක කර්මාන්තය ආශ්‍රිතව කඳු නගින අයට මගපෙන්වීම, භාණ්ඩ අලෙවි කිරීම හා බර උසුලාගෙන යාම වැනි රැකියාද කරනු ලබයි.
- කාන්තාවෝ රෙදි විවීම, නූල් ගෙතීම කරනු ලබයි.
- දඩයමින් ලබාගන්නා මස් වර්ගද අලෙවියෙන් මුදල් ලබාගනී.





# නිවාස

- ඔවුන්ගේ නිවාස ගල්, ලී කුඩු, මැටි, ලී දඬු වැනි කඳුකරයෙන් සොයාගත හැකි දේ ඇසුරින් ඉදිකර ඇත.
- වහලය තෘණ විශේෂ භාවිතයෙන් සෙවිලි කර ඇත.
- එකම ස්ථානයක නිවාස තැනීම විශේෂ ලක්ෂණයකි.
- කඳුකරයේ සංචරණ සත්ත්ව පාලනය කරන අය තාවකාලිකව නිවාසවල ගත කරමින් තැනින් තැනට ගමන් කරයි.





# ආහාර

- වී, තිරිඟු, ඉරිඟු, මුංඇට, මිලට් ධාන්‍ය හා එලවළු බෝග ලෙස වගා කරනු ලබයි.
- වනාන්තරයේ වැවෙන අලවර්ග, මී පැණි, සතුන්, දඩයම, (මස් වර්ග) ආහාරයට ගනී.







# නිම්න භූ දර්ශනය

- දකුණු ආසියා කලාපයේ සුවිශේෂී නිම්න භූ දර්ශන කිහිපයක් දැකිය හැක.

  ඉන්දියාවේ ගංගා නම් නිම්නය


  පාකිස්ථානයේ සින්දු නිම්නය

  ශ්‍රී ලංකාවේ මහවැලි හා කැලණි ගං නිම්න

  (මේ අතරින් විශාලම ගංගා නිම්නය ගංගා නම් නදියේ ගං නිම්නයයි.)



# නිම්න භූ දර්ශනය (ගංගා ගං නිම්නය ඇසුරෙන්)




## ගංගා නම් ගංගාවේ භෞතික දර්ශනය

- හිමාලය කඳුකරයෙන් ඇරඹේ.
- 2010 Km පමණ දිගය.
- බෙංගාල බොක්කෙන් මුහුදට වැටේ.
- මෙම නිම්නය දෙපස විවිධ භූ දර්ශන දැකිය හැක.
- එම ගං නිම්නයේ ආරම්භය කඳුකර භූ දර්ශනයට අයත් වේ.
    - මධ්‍යම හා පහළ නිම්නවලට ආවේණික භෞතික ලක්ෂණ හා මානුෂ ක්‍රියාකාරකම් දැකිය හැක.
    - ගඟ දිගේ පහළට වනවිට රැළිබිම්, හැඩපළු, ගංගා, ගංදහර, තැනිබිම්, පිටාර තැනි, වැලිතලා, පළල් ගංගා නිම්න ඒ අතර වේ.
    - මීටර් 20ට වැඩි උස්බිම් ඇත්තේ කලාතුරකිනි.





- මීටර් 20ට වැඩි උස්බිම් ඇත්තේ කලාතුරකිනි.

# ගංගා නම් ගංගා නිම්නයේ මානුෂ භූ දර්ශනය



## සංස්කෘතික ලක්ෂණ

- ගංගා නම් ගංගා නිම්නයේ හින්දු, බෞද්ධ හා වෙනත් ආගම්වල පූජනීය ස්ථාන රාශියක් පිහිටා ඇත.
- හින්දු බැතිමතුන්ගේ ශුද්ධ වූ නදිය ගංගා නදියයි.
- විවිධ භාෂා, විවිධ ආගම් අදහන ජනතාව මෙම ප්‍රදේශයේ වාසය කිරීමෙන් මෙහි සුවිශේෂී භූ දර්ශනයක් බිහිවී තිබේ.

# මානුෂ ක්‍රියාකාරකම්

## 1. කෘෂිකර්මය

- කෘෂිකර්මය ප්‍රධානතම ජීවනෝපායයි.
- වී, තිරිඟු, උක් ප්‍රධාන වගාවන් වේ. දියළු පස ඒ සඳහා ප්‍රයෝජනවත් වේ.
- අන්තගාමී දේශගුණ තත්වයන් පවතින ප්‍රදේශවල ගැඹුරු ළිං මඟින් ජල සම්පාදනය කර කපු, උක් වගාකරනු ලබයි.
- මධ්‍යම ගංගා නිම්නයේ වී සහ තිරිඟු වගාබිම් ව්‍යාප්ත වී ඇත.
- පහළ ගංගා ඩෙල්ටා ප්‍රදේශයේ බංගලාදේශයේ සුන්දරබාන් වගුරුබිම ආශ්‍රිතව "රන්කෙඳි "ලෙස හඳුන්වන "ජූට්" වගා කරනු ලබයි. (බංගලාදේශයේ ප්‍රධාන වගාව)
- මෙම කලාපය තුළ අධික ජන සංඛ්‍යාවක් ජීවත්වන නිසා ලාභ ශ්‍රමය මූලික කොට කෘෂිකර්මාන්තයත්, අනෙකුත් කර්මාන්තත් ව්‍යප්ත වී ඇත.

# කර්මාන්ත

- මෙම ගංගා නිම්න ආශ්‍රිතව දිල්ලිය, පැට්නා, අග්‍රා, වරානසි, කොල්කටා, ඩැකා වැනි ප්‍රධාන නගර ව්‍යාප්තව ඇති එම නගරයන්හි කර්මාන්ත බහුලව ව්‍යාප්තව ඇත.
- දිල්ලිය, කාන්පූර්, පැට්නා, කොල්කටා, ජනාධික නගර වන අතර, මෙම නගර පුරා පැතිරුණු මාර්ග ජාලයක් පවතී. විශාල වාණිජ මධ්‍යස්ථාන රාශියක්ද දැකිය හැක.







මෙම ගංගා නිම්නයේ ඉහළ සිට පහළට (අග්‍රා සිට පැට්නා තෙක්) ගමන් කරන්නෙකු හට,

ඉහළ ගංගා නිම්නයේ,

- ඝන වැසි වනාන්තර ඇත
- අඩු ජන සංඛ්‍යාවක් දක්නට ලැබේ







මධ්‍යම ගංගා නිම්නයේ

- අධික ජන සංඛ්‍යාවක් ජීවත් වේ
- වී සහ තිරිඟු වගාකිරීම ප්‍රධානවම සිදුවේ.












පහළ ගංගා නිම්නයේ,

- අධික ජන පීඩනය
- ජලය අපවිත්‍ර වීම
- ජල ගැලීම්
- පීඩාකාරී පරිසරයක්

ලෙසට භූ දර්ශනයේ වෙනස්වීම දැකිය හැක.








# වෙරළබඩ භූ දර්ශනය

- දකුණු ආසියාව දිගු වෙරළ තීරයක් හිමි කලාපයකි.
- නේපාලය, භූතානය, යන දෙරටට වෙරළ තීරයක් අහිමිවිය.
- ශ්‍රී ලංකාව හා මාලදිවයින් දූපත් රාජ්‍ය වන අතර වෙරළබඩ භූ දර්ශනය කැපී පෙනේ.




# මාලදිවයින

- මාලදිවයින් රාජ්‍යය, දූපත් 1200කට වැඩි සංඛ්‍යාවකින් සැදුම් ගෙන ඇත. ඉන් කොරල්පර අතොළු හැර දූපත් 200ක  පමණ ජනයා වාසය කරති.
- කැපී පෙනෙන භූ ලක්ෂණ අතර වැලිපර, කලපු, බොකු, තුඩු, කොරල්පර, කඩොලාන දැකිය හැක.
- වෙරළබඩ භූ දර්ශනය ආශ්‍රිත ආර්ථික කටයුතු අතර

    *ධීවර කර්මාන්තය

    *සංචාරක ව්‍යාපාරය ප්‍රමුඛ වේ.









# මාලදිවයිනේ ධීවර කර්මාන්තය

- ශ්‍රී ලංකාව හා මාලදිවයින් රාජ්‍යයේ වෙරළ තීරයේ ඇති කඩතොළු සහිත බව හා නොගැඹුරු පස මුහුදු තීරය ධීවර කටයුතුවලට මූලික පසුබිමක් නිර්මාණය කරයි.
- ධීවර කර්මාන්තය ආශ්‍රිත ධීවර වරාය, ඒ ආශ්‍රිත නගර හා ගම්මානද සංවර්ධනය වී ඇත.

## ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරම්

i. කරවල වේලීම

ii. උම්බලකඩ වේලීම

iii. වෙනත් අතුරු නිෂ්පාදන (කරවල ආශ්‍රිත)

iv. මාලු වෙළඳාම

v. මාළු ටින් කිරීම

vi. සිප්පි කටු/විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය





# ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරම්












## මාලදිවයිනෙහි සංචාරක කර්මාන්තය

- මාලදිවයිනෙහි සංචාරක ව්‍යාපාරයට වෙන් වූ දූපත් රාශියක් ඇත.
- එම කලාපයේ සංචාරක කර්මාන්තය දියුණුවීමට බලපා ඇති හේතු ආශියක් ඇත.(සංචාරක ආකර්ෂණ කරුණු)
  - ✓ කොරල්පර සහිත නොගැඹුරු මුහුද
  - ✓ වෙරළ ආශ්‍රිත ජෛව විවිධත්වය
  - ✓ දර්ශනීය සුදු වැලිතලා සහිත වෙරළ
  - ✓ දියුණු කළ හෝටල් පහසුකම්
  - ✓ පැහැදිලි ජලය
  - ✓ හිරු එළිය විඳගත හැකි ස්ථාන බහුල වීම
  - ✓ රක්ෂිත කලපු/ හුදෙකලා දූපත් සහිත ස්වාභාවික වරාය





# මාලදිවයිනෙහි සංචාරක කර්මාන්තය





# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය

- ශ්‍රී ලංකාවේ විශේෂ සංචාරක ආකර්ෂණ කලාප කිහිපයකි.

### දක්ෂිණ මුහුදු තීරය

- උණවටුණ
- රූමස්සල
- ගාල්ල වැනි ප්‍රදේශ

### නැගෙනහිර වෙරළ තීරය

- නිලාවේලි
- පාසිකුඩා
- ආරුගම්බේ වැනි ප්‍රදේශ






ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රදේශ ආශ්‍රිත රැකියා රාශියක් බිහි වී ඇත.

- හෝටල් ආශ්‍රිත රැකියා
- සංචාරක මග පෙන්වන්නන්
- විසිතුරු භාණ්ඩ අලෙවිය
- වෙළඳාම
- ආයුර්වේද මධ්‍යස්ථාන
- වරාය ආශ්‍රිත රැකියා




# ශ්‍රී ලංකාවේ වෙරළ ආශ්‍රිත නගර රාශියක් බිහිවී ඇත.

- කොළඹ
- ගාල්ල
- මීගමුව
- ත්‍රිකුණාමලය
- හම්බන්තොට







# ශ්‍රී ලංකාවේ වෙරළ භූ දර්ශනය තුළ ජෛව විවිධත්වය

- වෙරළ භූ දර්ශනය තුළ ජෛව විවිධත්වය ඉහළ මට්ටමක පවතී

  උදා- කඩොලාන, තෙත් බිම්, වගුරු බිම් වැනි පරිසර පද්ධතිය

- එම පරිසර පද්ධති තුළ ශාක විශේෂ, උරග විශේෂ, පක්ෂි විශේෂ හා මත්ස්‍ය විශේෂ බහුලව දැකිය හැක.








## වෙරළ ඉතා සංවේදී කලාපයක් වුවද මිනිස් ක්‍රියාකාරකම් මගින් විවිධ පාරිසරික ගැටලු ඇති වේ.

- **මිනිස් ක්‍රියාකාරකම්**
  - I. අනවසර ඉදි කිරීම්
  - II. හිරිගල් කැඩීම
  - III. තෙත්බිම්,කඩොලාන බිම් විනාශ වීම
  - IV. වගුරු,පහත් බිම් ගොඩ කිරීම
- **එමගින් ඇතිවන ප්‍රතිඵල**
  - I. වෙරළ ඛාදනය
  - II. පරිසර දූෂණය
  - III. විවිධ අපචාර ක්‍රියා වැඩිවීම







# ග්‍රාමීය භූ දර්ශනය

(ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ග්‍රාමීය භූ දර්ශනය ඇසුරෙනි)

- දකුණු ආසියාවේ බහුලව දැකිය හැක්කේ ග්‍රාමීය භූ දර්ශනය යි.

## ග්‍රාමීය භූ දර්ශනයෙහි සුවිශේෂතා

- ආර්ථික කටයුතු අතර කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය වැනි කටයුතු දක්නට ඇත.
- ජන ඝනත්වය අඩුය.
- ජනාවාස විවිධ රටා පදනම්ව හැඩ ගැසී ඇත.

  උදා-කඩමණ්ඩිය ආශ්‍රිත නිවාස රටා

  වැවිලි සහිත වතු ආශ්‍රිත නිවාස රටා
- කෘෂිකාර්මික නිෂ්පාදන පහසුකම් කරගත් කර්මාන්තද දැකිය හැක.





# ග්‍රාමීය කෘෂිකර්මාන්තය (ශ්‍රී ලංකාවේ වියළි කලාපීය)

- ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම කෘෂිකර්මාන්තයයි.

## කුඹුරු ගොවිතැන

- වැව කේන්ද්‍ර කරගත් ප්‍රධාන ආර්ථික භෝගය වන වී වගාව වැඩි ව්‍යාප්තියක් පෙන්වයි.
- රටේ මුළු සහල් නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් මෙම කලාපයේ නිපදවයි.





## හේන් වගාව

- වී වගාව සිදුකළ නොහැකි උස්බිම්වල හේන් වගාව සිදු වේ.
- හේන්වල ධාන්‍ය වර්ග, එළවළු, පලතුරු වගා කරනු ලබයි.
- හේන්වගාව ග්‍රාමීය භූ දර්ශනය හි සුවිශේෂී ලක්ෂණයකි




## සත්ත්ව පාලනය

- ගවයා ඇති කරනු ලබන ප්‍රධාන සත්ත්වයා වේ.
- කිරි ආහාර ලබාගැනීමට සහ  වී ගොවිතැනේ විවිධ කටයුතු සඳහාත් ගවයා ප්‍රයෝජනයට ගනී.



- ග්‍රාමීය ප්‍රදේශවල වාරිමාර්ග කටයුතු හා ජල සම්පාදන ව්‍යාපාර ආශ්‍රිත සැලසුම් සහගත නගර ඉදිකිරීම මගින් ග්‍රාමීය භූ දර්ශනය වෙනස් වෙමින් පවතී.

උදා-ගල් ඔය
උඩවලව
මහඔය

} සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන නගර



# කාර්මික හා නාගරික භූ දර්ශනය

- **නාගරික භූ දර්ශනයක දැකිය හැකි ලක්ෂණ**
  - මාර්ග ජාල
  - සන්නිවේදන ජාල
  - වාසස්ථාන හා පරිපාලන මධ්‍යස්ථාන ඇතුළුව ඉදිකළ ප්‍රදේශ බහුලවීම
  - ජනතාව බහුල වීම
  - සේවා පහසුකම් බහුල වීම
- **දකුණු ආසියාවේ පිහිටි කාර්මික හා වාණිජ ක්‍රියාකාරකම් ආශ්‍රිත දියුණු නගර**
  - ඉන්දියාවේ- මුම්බායි, දිල්ලිය, චෙන්නායි, කොල්කටා
  - පාකිස්ථානයේ- ඉස්ලාමාබාද්, කරච්චිය
  - ශ්‍රී ලංකාව- කොළඹ








# කාර්මික හා නාගරික භූ දර්ශනය (ඉන්දියාවේ මුම්බායි නගරය ආශ්‍රිතව)

- නිවාස ඝනත්වය අධිකය. බොහෝවිට තට්ටු නිවාස සංකීර්ණ (සිරස් ව්‍යාප්තිය) දැකිය හැක.
- මුම්බායි ස්වාභාවික වරායක් ලෙස වර්ධනය වූ නගරයක් වන අතර ඉන්දියාවේ දෙවැනි විශාලතම නගරයයි.
- සීමිත භූමි ප්‍රමාණයක අධික ජන සංඛ්‍යාවක් වාසය කරති.
- කර්මාන්ත හා සේවා කටයුතු වර්ධනය වී ඇත.
- අඩු පහසුකම් සහිත ජනාවාස බහුලය (සැලසුමකින් තොරව ඉදිකළ)
- මිනිසුන්ගේ දෛනික සංචලතාව ඉතා අධිකය.



## මෙම නගරයේ විශේෂතා

- මුම්බායි ලොව දෙවන විශාලතම සිනමා කර්මාන්තය පිහිටි නගරයි. එය බොලිවුඩ් නමින් ලොව ප්‍රචලිතය.
- ඩෙකෑන් කළු පස්තීරයට ආසන්න නිසා මුල් කාලයේදී කපු කර්මාන්තය ආශ්‍රිත වෙළඳපොලක් ලෙස වර්ධනය විය.
- මෙම නගරයේ අධ්‍යාපන හා සේවා පහසුකම් බහුලය. විවේකය විනෝදය සඳහා ජනයා ඇදී ඒමද බහුලය. ඒ සඳහා සේවා පහසුකම් සපයා ඇත.

### නාගරික භූ දර්ශනය ආශ්‍රිත ගැටලු



- ඉඩම් හිඟය
- වීදි ජනයා බහුල වීම
- මාර්ග තදබදය
- පරිසර දූෂණය
- අඩු ආදායම් ජනාවාස බහුල වීම
- අපචාර බහුල වීම



# කාන්තාර භූ දර්ශනය
## (තාර් කාන්තාරය ඇසුරෙනි)

- ඉන්දු පාකිස්ථාන් දේශසීමාවේ රාජස්ථාන් ප්‍රාන්තයේ තාර් කාන්තාරය පිහිටා ඇත.
- මෙම භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ
  - වැලිතලා සහිත පැතිරුණු භූමිය
  - 25 mmට අඩු වර්ෂාපතනය
  - අධික වාෂ්පීකරණයක් පැවතීම
  - අධික උෂ්ණත්වයක් පැවතීම
  - දැඩි උෂ්ණත්වය නිසා පවත්නා වියළි සුළං
  - පසේ තෙතමනය ඉතා අඩු වීම.






# තාර් කාන්තාර භූ දර්ශනයේ භෞතික ලක්ෂණ

- තාර් කාන්තාරය විශාල වශයෙන් පැතිරුණු භූගත ජල ද්‍රෝනයක් ඇති ප්‍රදේශයකි.
- ශාකවර්ග පොළොවේ ගැඹුරට මුල් විහිදුවමින් ජලය උරාගනී.
- භූගත ජලය ගැඹුරු ළිං ඇසුරින් ලබාගෙන මිනිසුන් වගා කටයුතු කරති
- ජල උල්පත් සහිත මෙම ක්ෂේම භූමිවල ජනයා ඒකරාශී වී ඇත.
- එම ක්ෂේම භූමිවල උක්, කපු, මිලට් වැනි භෝග වගාවත්, සත්ත්ව පාලනයත් ප්‍රචලිත අතර භාණ්ඩ ප්‍රවාහනයට ඔටුවා භාවිත කරති.
- කපු ඇඳුම් උෂ්ණත්වයට ඔරොත්තු දීමට භාවිතා කරති. නිවාසවල පරිසරයට අනුව විවිධ වර්ණ ආලේප කර ඇත.

## ගැටලු

- අවිධිමත් ලෙස වගා කිරීම නිසා කාන්තාරය පැතිරීම
- සත්ත්ව පාලන කටයුතු සඳහා අධික ලෙස තෘණ භාවිතය නිසා  භූමිය නිසරු වී ඇත.

**සවියෙන් පෙරට - අපි එකට**

**e - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | භූගෝල විද්‍යාව | 2 | 03. දකුණු ආසියාව<br>--- ඇගයීම--- |

**සැකසුම- කේ.රාජිකා කුමුදුනී මිය, බප/හො/දීපාලෝක මහා විද්‍යාලය**

**03.1** දකුණු ආසියාව

I. දකුණු ආසියානු රටවල් හත නම් කරන්න.

II. දකුණු ආසියාව සුවිශේෂී භූගෝලීය කලාපයක්වීමට හේතු දෙකක් දක්වන්න.

III. ලොව ඉහළම උන්නතාංශය කුමක්ද?

IV. දකුණු ආසියානු කලාපයේ

a. සාපේක්ෂ පිහිටීම

b. නිරපේක්ෂ පිහිටීම වෙන් වෙන්ව දක්වන්න.

V. සාර්ක් සංවිධානයට අයත් රටවල් අතරින් මධ්‍යම ආසියාවට අයත් රට කුමක්ද?

VI. දකුණු ආසියානු රටවල අගනුවරවල් නම් කරන්න.

VII. දකණු ආසියා කලාපයේ විශාලතම රට කුමක්ද?

**03.2** කඳුකර භූ දර්ශනය

I. කඳුකර භූ දර්ශනයක ලක්ෂණ දැකිය නොහැකි රට කුමක්ද?

II. ඉන්දියාවට අයත් කඳුවැටි තුනක් නම් කරන්න.

III. හිමාලය කඳුවැටියේ උස (මුහුදු මට්ටමේ සිට) සහ දිග කොපමණද?

IV. හිමාල කඳුවැටියේ වඩාත් උණුසුම් දේශගුණික ලක්ෂණ දැකිය හැක්කේ කොහේදීද?

V. හිමාල කඳුකරයේ ජීවත්වන මොංගොලොයිඩ් ජන වර්ගයට අයත් ගෝත්‍රික ජනවර්ග පහක් නම් කරන්න.

VI. එම ගෝත්‍රික ජනතාවගේ සුවිශේෂී ලක්ෂණ තුනක් ලියන්න.

VII. පහත වගුව සම්පූර්ණ කරන්න.

| හිමාල කඳුකරයේ භූ විෂමතා | ජීවත් වන ජන වර්ග | ඔවුන්ගේ ආහාර | රැකියා | වගාවන් |
|---|---|---|---|---|
| | | | | |

**03.3** නිම්න භූ දර්ශනය

I. නිම්න භූ දර්ශනයට අදාළ දකුණු ආසියානු නිදසුන් තුනක් දක්වන්න.

II. ගංහා නම් ගඟේ දිග කොපමණද? එය ඉන්දියන් සාගරයට එකතු වන්නේ කුමන රටකදීද?

III. ගංහා නිම්නයේ දැකිය හැකි භූ රූප වර්ග පහක් නම් කරන්න.

IV. ගංහා නම් ගංගා නිම්නය සංස්කෘතික වශයෙන් වඩා වැදගත් වන්නේ ඇයි?

V. මෙම නිම්නයේ වගා කරනු ලබන බෝග තුනක් නම් කරන්න.

VI. බංගලාදේශයේ "ජූට්" වගාවට ප්‍රසිද්ධ ප්‍රදේශය කුමක්ද? එම ජූට් හඳුන්වන අන්වර්ථ නාමය කුමක්ද?

VII. නිම්න භූ දර්ශනයේ කර්මාන්ත ව්‍යාප්තිය ප්‍රධානව දක්නට ලැබෙන නගර තුනක් නම් කරන්න.

VIII. මෙම කලාපයේ ජනාධික නගර තුනක් නම් කරන්න.

**03.4** වෙරළබඩ භූ දර්ශනය

I. වෙරළ තීරයක් අහිමි වූ දකුණු ආසියානු රටවල් දෙක නම් කරන්න.

II. මාලදිවයිනට අයත් දූපත් ගණන කොපමණද?

III. වෙරළ භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ මොනවාද?

IV. මාලදිවයිනෙහි ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් පහක් නම් කරන්න.

V. මාලදිවයිනෙහි සංචාරක කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු හතරක් ලියන්න.

VI. ශ්‍රී ලංකාවෙහි සංචාරක ප්‍රදේශ ආශ්‍රිත රැකියා හතරක් ලියන්න.

VII. ශ්‍රී ලංකාවේ වෙරළ තීරයෙහි ඇති ජෛව විවිධත්වයන් ඇති පරිසර පද්ධති තුනක් නම් කරන්න.

VIII. වෙරළ පරිසරයට ගැටලු ඇතිකරන මානුෂ ක්‍රියාකාරකම් තුනක් සහ ඒවායෙහි අහිතකර ප්‍රතිඵල දෙකක් නම්කරන්න.

**03.5 ග්‍රාමීය භූ දර්ශනය**

I. ග්‍රාමීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සඳහන් කරන්න.
II. ශ්‍රී ලංකාවේ වියළි කලාපය ආශ්‍රිත කෘෂිකර්මාන්තයෙහි ලක්ෂණ තුනක් ලියන්න.
III. ග්‍රාමීය භූ දර්ශනය වෙනස්වෙමින් පවතී. එයට හේතු දෙකක් දක්වන්න.

**03.6 කාර්මික හා නාගරික භූ දර්ශනය**

I. නාගරික භූ දර්ශනයක දැකිය හැකි ලක්ෂණ තුනක් නම් කරන්න.
II. ඉන්දියාවේ මුම්බායි නගරයෙහි නාගරික භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ හතරක් දක්වන්න.
III. නාගරික භූ දර්ශනය තුළ මතුව ඇති ගැටලු හතරක් නම් කරන්න.
IV. ලංකා සිතියමක කාර්මික හා නාගරික භූ දර්ශනය ව්‍යාප්ත නගර පහක් ලකුණු කරන්න.
V. ලොව දෙවන විශාලතම සිනමා කර්මාන්තය කුමක්ද?

**03.7 කාන්තාර භූ දර්ශනය**

I. දකුණු ආසියානු කලාපයේ කාන්තාර භූ දර්ශනය ව්‍යාප්ත ප්‍රදේශයක් දක්වන්න.
II. එහි කැපී පෙනෙන ලක්ෂණ හතරක් දක්වන්න.
III. කාන්තාර භූ දර්ශනයේ මානුෂ ක්‍රියාකාරකම් දෙකක් නම් කරන්න.
IV. කාන්තාර භූ දර්ශනයෙහි මිනිස් ක්‍රියාකාරකම් නිසා වැඩි වර්ධනය වන ගැටලු දෙකක් ලියන්න.

**සවියෙන් පෙරට - අපි එකට**

**ℯ - ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | භූගෝල විද්‍යාව | 2 | 03. දකුණු ආසියාව<br>--- පිළිතුරු--- |

**සැකසුම- කේ.රාජිකා කුමුදුනී මිය, බප/හො/දීපාලෝක මහා විද්‍යාලය**

**03.1 දකුණු ආසියාව**

I. මාලදිවයින, ලංකාව, ඉන්දියාව,නේපාලය,පාකිස්තානය,භූතානය,බංගලාදේශය

II. මුහුදු මට්ටමේ පිහිටි සුන්දරබාන් වගුරු බිම මෙන්ම ලොව ඉහළම උන්නතාංශය දක්වන එවරස්ට් කඳු මුදුන පිහිටීම, අධික සීතල ප්‍රදේශ මෙන්ම අධික උෂ්ණත්වයක් ඇති ප්‍රදේශ පිහිටීම

III. එවරස්ට් කඳු මුදුන

IV. a) සාපේක්ෂ පිහිටීම - උතුරින් හිමාලය, දකුණින් ඉන්දියන් සාගරය

නැගෙනහිරින් බෙංගාල බොක්කෙන්ද

බටහිරින් අරාබි මුහුදින්ද මායිම් වී ඇත.

b) නිරපේක්ෂ පිහිටීම- උතුරු අක්ෂාංශ 0° සිට උතුරු අක්ෂාංශ 30°දක්වාත්.

නැගෙනහිර දේශාංශ 60°-100° දක්වාත්

V. ඇෆ්ගනිස්ථානය

VI. ශ්‍රී ලංකාව- ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ

ඉන්දියාව- නව දිල්ලිය

පාකිස්ථානය- ඉස්ලාමාබාද්

මාලදිවයින- මාලේ

බංගලාදේශය- ඩැකා

භූතානය- තිම්පු

නේපාලය- කත්මන්ඩු

VII. ඉන්දියාව

**03.2** කඳුකර භූ දර්ශනය

I. මාලදිවයින

II. හිමාලය, කාරකෝරම්, කුන්ලුන්ෂාන්

III. උස-මුහුදු මට්ටමේ සිට මී 8000ට වැඩි
දිග-2500 කි.මී

IV. වඩාත් උණුසුම්- නේපාලයේ ටෙරායි නිම්නය

V. භූටියා, කසා, දරඩ්, ලෙප්චා, ෂෙර්පා

VI. කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය, භාණ්ඩ අලෙවි කිරීම හා බර උසුලාගෙන යෑම.
කඳු නගින අයට මඟ පෙන්වීම
ශක්තිමත් පැතලි පතුල් සහිත පාද, ශක්තිමත් බාහු
අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට හැකි අයුරින් සකස් වූ පෙනහළු

VII.

| හිමාල කඳුකරයේ භූ විෂමතා | ජීවත් වන ජන වර්ග | ඔවුන්ගේ ආහාර | රැකියා | වගාවන් |
|---|---|---|---|---|
| කඳු | භූටියා | වී | කෘෂි කර්මාන්තය | වී |
| නෙරු | කසා | තිරිඟු | සත්ත්ව පාලනය | තිරිඟු |
| ගැඹුරු ගංදොරු | දරඩ් | ඉරිඟු | භාණ්ඩ අලෙවි කිරීම හා බර උසුලාගෙන යෑම. | ඉරිඟු |
| දුර්ග | ලෙප්චා | මුංඇට | කඳු නගින අයට මඟ පෙන්වීම | මුංඇට |
| උස්බිම් | ෂෙර්පා | මිලට් | රෙදි විවීම | මිලට් |
| සානු | | මස් | නූල් ගෙතීම | එළවළු |
| කපොලු | | එළවළු | | |

**03.3** නිම්න භූ දර්ශනය

I. ඉන්දියාව- ගංගා නම් නිම්නය
පාකිස්ථානය- සින්දු නිම්නය
ශ්‍රී ලංකාවේ- මහවැලි සහ කැළණි ගං නිම්න

II. 2510 කි.මි.
බංගලාදේශය

III. රැළිබිම්, හැඩපළු ගංගා, ගං දහර, තැනිබිම්, පිටාර තැනි, වැලිතලා

IV. විවිධ භාෂා කතා කරන විවිධ ආගම් අදහන ජනයා මෙම ප්‍රදේශයේ වාසය කිරීම

V. වී වගාව, තිරිඟු, උක් ,කපු ,ජූට්

VII. සුන්දරබාන් වගුරු බිම රන්කෙඳි

VII. දිල්ලිය , පැට්නා, අග්‍රා, වරානසි, කොල්කටා

VIII. දිල්ලිය, කාන්පූර්, පැට්නා, කොල්කටා

**03.4 වෙරළබඩ භූ දර්ශනය**

I. නේපාලය, භූතානය

II. 1200ක්ට වැඩි

III. වැලිපර, කලපු, බොක්ක, තුඩු, කොරල්පර

IV. කරවල වේලීම, උම්බලකඩ සැදීම, මාළු ටින් කිරීම, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය
මාළු වෙළදාම

V. *කොරල්පර සහිත නොගැඹුරු මුහුද

*වෙරළ ආශ්‍රිත ජෛව විවිධත්වය

*දර්ශනීය සුදු වැලිතලා සහිත වෙරළ

* පැහැදිලි ජලය

*නවීන හෝටල් පහසුකම්

VI. හෝටල් ආශ්‍රිත රැකියා, වෙළදාම, වරාය ආශ්‍රිත රැකියා, විසිතුරු භාණ්ඩ අලෙවිය
ආයුර්වේදය මධ්‍යස්ථානය

VII. කඩොලාන, තෙත්බිම්, වගුරු

VIII. අනවසර ඉදිකිරීම්, හිරිගල් කැඩීම, කඩොලාන පද්ධති විනාශ කිරීම, වෙරළ ඛාදනය
පරිසර දූෂණය

**03.5 ග්‍රාමීය භූ දර්ශනය**

I. *ජන ඝනත්වය අඩුයි.

*ජනාවාස විවිධ රටා අනුව හැඩගැසී තිබීම

*කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය හා කෘෂිකාර්මික නිෂ්පාදන පදනම් කරගත්
කර්මාන්ත තිබීම.

II. වැව කේන්ද්‍ර කරගත් වී වගාව, උස්බිම්වල හේන් වගාව, සත්ත්ව පාලනය (ගව)

III. සංවර්ධන ව්‍යාපෘති, තාක්ෂණික දියුණුව

**03.6 කාර්මික හා නාගරික භූ දර්ශනය**

I. මාර්ග ජාල, සන්නිවේදන ජාල, වාසස්ථාන, පරිපාලන මධ්‍යස්ථාන ඉදිකල ප්‍රදේශ බහුලවීම

II.

- නිවාස සනත්වය අධිකය (බොහෝවිට සිරස් ව ව්‍යාප්තව ඇත.)
- අතිශයින් සීමිත වූ භූමි ප්‍රමාණයක අධික ජන සංඛ්‍යාවක් වාසය කරති
- කර්මාන්ත හා සේවා කටයුතු වර්ධනය වී තිබේ.
- සැලසුමකින් තොරව ඉදිවූ අඩු පහසුකම් සහිත ජනාවාස විශාල වශයෙන් ඇත.
- මිනිසුන්ගේ දෛනික සංචලතාවය ඉතා අධිකය.

III. කොළඹ, ගම්පහ, මහනුවර, කළුතර, ගාල්ල වැනි නගර ලකුණු කරන්න.

IV. බොලිවුඩ්

**03.7 කාන්තාර භූ දර්ශනය**

I. ඉන්දු පාකිස්ථාන් දේශසීමාවේ රාජස්ථාන් ප්‍රාන්තයේ පිහිටා ඇති තාර් කාන්තාරය.

II.

- වැලිතලා සහිත පැතිරුණු භූමිය
- මිලිමීටර 250ට අඩු වර්ෂාව
- අධික වාෂ්පීකරණයක් පැවතීම
- අධික උෂ්ණත්වයක් පැවතීම
- පසේ තෙතමනය ඉතා අඩු වීම

III. * ක්ෂේම භූමි ආශ්‍රිතව උක්, කපු, මිලට් වැනි භෝග වගා කිරීම

*සත්ත්ව පාලනය

IV. * අවිධිමත් වගාව නිසා කාන්තාරය ව්‍යාප්ත වීම

*සත්ත්ව පාලන කටයුතු සඳහා අධික ලෙස තෘණ භාවිතයෙන් භූමිය නිසරු වීම